ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකය: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |
| දිනය | 2015 ජුනි 02 |

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එක්සත් ජනපද ඩොලර් මිලියන 650.0 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හා එක්සත් ජනපද ඩොලර් මිලියන 338.0 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංකාව) වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී.ල.ම.බැ.) වසර 10 ක පරිණත කාලයක් සහිතව එක්සත් ජනපද ඩොලර් මිලියන 650.0 ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඵලදා අනුපාතිකය සියයට 6.125 ක් යටතේ 2015 මැයි 28 දින සාර්ථක ලෙස නිකුත් කරන්නට යෙදිණි.

එම දිනයේම ශ්‍රී.ල.ම.බැ. විසින් වසර 1 මාස 1 ක පරිණත කාලයක් සඳහා 6 මාසික ලංඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (LIBOR) මත පාදක අංක 316.69 ක බර තබන ලද ආන්තික සාමාන්‍යයක් යටතේ එ.ජ.ඩොලර් මිලියන 329 ක වටිනාකමින් යුතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ශ්‍රී.ල.ස.බැ.) ද වසර 2 මාස 11 ක පරිණත කාලයක් සඳහා ලංඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (LIBOR) මත පාදක අංක 353.89 ක බර තබන ලද ආන්තික සාමාන්‍යයක් යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 9.0 ක වටිනාකමින් යුතු ශ්‍රී.ල.ස.බැ. ද සාර්ථක ලෙස නිකුත් කරන්නට යෙදුණේය.

ඒ අනුව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා ශ්‍රී.ල.ස.බැ. තුළින් සමස්ත වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 988 ක් සියයට 5.261 ක බර තබන ලද සාමාන්‍ය පිරිවැයක් යටතේ නිකුත් කෙරිණි.